ARY OF THE NATIONAL ST
FEB 197
COLOMBO

# ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත

[සහතිකය සටහන් කළේ 1977 ජනවාරි මස 7 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1977 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත

[සහතිකය සටහන් කළේ 1977 ජනවාරි මස 7 වන දින]

එල්. ඩී.—ඕ. 19/76.

එක්තරා නියත කාලයක් ව්‍යවස්ථාදායකයේ සේවය කළ මන්ත්‍රීවරයන් උදෙසා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**සංක්ෂිප්ත නාමය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**විශ්‍රාම වැටුප් ක්‍රමය ඇති කිරීම.**

2. ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයන්ව සිටීම අවසන් වී ඇති තැනැත්තන්ට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම සඳහා (මෙහි මින් මතු "විශ්‍රාම වැටුප් ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) දායක මුදල් නොගෙවන විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කරනු ලැබේ.

**පනත අදාළ කිරීම.**

3. 1931 ජූලි මස 7 වන දිනයෙන් පසු ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් සේවය කළා වූ ද මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටින්නා වූ ද යම් තැනැත්තෙක්, මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව මේ පනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේ ය.

**ව්‍යවස්ථාදායකයේ සේවා කාලය.**

4. ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් මුළුමනින් අවුරුදු පහක් වූ අවම කාලයක් සේවය කළ යම් තැනැත්තෙක්, ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකුට දැනට ගෙවනු ලබන මූලික මාසික දීමනාවෙන් තුනෙන් පංගුවක් වන්නා වූ විශ්‍රාම වැටුපක් ද ඔහු මුළුමනින් අවුරුදු පහළොවක කාලයක් හෝ ඊට වැඩි කාලයක් මන්ත්‍රීවරයකු වශයෙන් සේවය කර ඇත්තේ නම් එකී මූලික මාසික දීමනාවෙන් උපරිම වශයෙන් තුනෙන් දෙපංගුවක් වන්නා වූ විශ්‍රාම වැටුපක් ද මාසිකව ගෙවනු ලැබීමට හිමිකම් ලබන්නේ ය :

එසේ වුව ද අවුරුදු පහකට වැඩි වුවත් අවුරුදු පහළොවකට අඩු වන්නා වූ කාලයක් ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් සේවය කළ යම් තැනැත්තකුට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කථානායකවරයා විසින් පිළියෙළ කරනු ලබන ගෙවීම් චක්‍රයකට අනුකූලව නිශ්චය කෙරෙන ප්‍රමාණානුකූල මාසික විශ්‍රාම වැටුපක් ලැබිය යුතු වන්නේ ය.

**විශ්‍රාම වැටුප් ගෙවිය යුත්තේ කවර විට ද යන වග.**

5. මේ පනත යටතේ ගෙවිය යුතු වන යම් විශ්‍රාම වැටුපක්, එම ගෙවීම ලැබීමට හිමිකම් ඇති තැනැත්තා ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුව සිටීම අවසන් වීමෙන් පසුව පමණක් ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද එම විශ්‍රාම වැටුප එකී තැනැත්තාගේ ජීවිත කාලය තුළ දී පමණක් ගෙවිය යුතු වන අතර ඔහුගේ මරණයෙන් පසු එය ගෙවිය යුතු වීම නතර වන්නේ ය.

8—ඒ 22823—10,819 (76/09)

නැවත තෝරා පත් කර ගැනීමේ බලපෑම.

6. මේ පනත යටතේ ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් ලබන යම් තැනැත්තකු ව්‍යවස්ථාදායකයට නැවත තෝරා පත් කර ගනු ලැබූ අවස්ථාවක, ඔහු නැවත තෝරා පත් කර ගනු ලැබූ දිනයෙහි සිට ඔහු ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකුව සිටීම අවසාන වන තෙක් ඔහුට එම විශ්‍රාම වැටුප නොලැබිය යුත්තේ ය.

විශ්‍රාම වැටුප ආගණනය කිරීමේ දී ඇතැම් කාලසීමා අත් හැරීම.

7. යම් ව්‍යවස්ථාදායකයක මන්ත්‍රීවරයකු, ඉල්ලා අස්වීමෙන් හෝ එම ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමෙන් හැර වෙනත් ආකාරයකින්, තත් කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ එම ව්‍යවස්ථාදායකයේ සිය අසුන හිස් කරන අවස්ථාවක, එම ව්‍යවස්ථාදායකයට ඔහු තෝරා පත් කර ගනු ලැබූ දිනයෙහි සිට එම හිස් කිරීම කළ දිනය තෙක් එම ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් වූ ඔහුගේ සේවා කාලය මේ පනත යටතේ යම් විශ්‍රාම වැටුපක් ආගණනය කිරීමේ කාර්යය සඳහා ගණන් නොගත යුත්තේ ය.

විශ්‍රාම වැටුප් ගෙවීමක් පවරා දීම හෝ ඉන් කිසි අයකිරීමක් කිරීම නොකළ යුතු බව.

8. මේ පනත යටතේ ගෙවිය යුතු කිසිම විශ්‍රාම වැටුපක් පවරා දීම හෝ පැවරීම නොකළ යුතු අතර එවැනි යම් පවරාදීමක් හෝ පැවරීමක් සම්පූර්ණයෙන්ම ශූන්‍ය ද බලරහිත ද කිසිදු බලපෑමකින් තොර ද වන්නේ ය. තවද ඒ කිසිම විශ්‍රාම වැටුපක්, එම විශ්‍රාම වැටුප ගෙවිය යුත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගෙන් අය විය යුතු යම් ණයක් හෝ ගෙවීමක් සම්බන්ධයෙන් ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා තහනමට ගැනීම හෝ ඉන් අයකිරීමක් කිරීම, හෝ අල්ලා ගැනීම හෝ ගැනීම හෝ, කරනු නොලැබිය යුත්තේ ය.

ජීවත්ව සිටින බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතු බව.

9. විශ්‍රාම වැටුපක් ගෙවීම කරනු ලබන අවස්ථාවේ දී ඒ ගෙවීම ලැබිය යුතු මන්ත්‍රීවරයා ජීවත්ව සිටින බවට සහතිකයක් ජාතික රාජ්‍ය සභාවේ ලේකම්වරයාට ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති කිසිදු තැනැත්තකුට කිසිදු විශ්‍රාම වැටුපක් ගෙවනු නොලැබිය යුතු ය.

ක්‍රමය පරිපාලනය කිරීම.

10. කථානායකවරයා විමසා ජාතික රාජ්‍ය සභාවේ ලේකම්වරයා විසින් විශ්‍රාම වැටුප් ක්‍රමය හා සම්බන්ධ කටයුතු කළමනාකරණය කළ යුතු අතර, සියලු ම විශ්‍රාම වැටුප් ගෙවීම්, එම කාර්යය සඳහා ජාතික රාජ්‍ය සභාවේ වැය ශීර්ෂ යටතේ ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන ලද මුදල්වලින් කරනු ලැබීමට ඔහු විසින් බලය දෙනු ලැබිය යුතු ය.

ඒකාබද්ධ අරමුදලින් ගෙවීම.

11. මේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප ඒකාබද්ධ අරමුදල කෙරෙහි වැයබරක් වන්නේ ය.

රීති.

12. කථානායකවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, විශ්‍රාම වැටුප් ක්‍රමය කළමනාකරණය කිරීම පිණිස මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි—

"ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයා" යන්නෙන්—

(අ) 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා) රාජ් සභා ආඥාව යටතේ පිහිටුවන ලද රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හෝ

(ආ) 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාව යටතේ පිහිටුවන ලද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබුවා වූ පළමුවන ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු ද ඇතුළු ව එකී නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ; හෝ

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාවේ හෝ

මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ.